# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2011 අංක 16 දරන ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බදු (ඉවත් කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2011 මාර්තු මස 31 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2011 අප්‍රේල් මස 01 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 2.00 යි. **තැපැල් ගාස්තුව :** රු. 5.00 යි.

# 2011 අංක 16 දරන ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බදු (ඉවත් කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2011 මාර්තු මස 31 වන දින]

එල්. ඩී.—ඕ. 6/2011.

**2006 අංක 51 දරන ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බදු පනත ඉවත් කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2011 අංක 16 දරන ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බදු (ඉවත් කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

**2.** (1) 2006 අංක 51 දරන ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බදු පනත, 2011 ජනවාරි මස 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි මෙයින් ඉවත් කරන ලද සේ සැළකිය යුතු ය. — ඉවත් කිරීම සහ ඉතිරි කිරීම්.

(2) ඉහත කී ඉවත් කිරීම නොතකා, (3) වන උපවගන්තියේ දක්වා ඇති කාරණා සම්බන්ධයෙන් මේ පනත ක්‍රියාත්මක වන දින සිට එක් වසරක කාලයක් සඳහා බලාත්මකව පැවතිය යුතු ය.

(3) 2011 ජනවාරි මස 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි, 2006 අංක 51 දරන ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බදු පනත ඉවත් කිරීම නොතකා, 2011 ජනවාරි මස 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි, (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති අවුරුදු එකක කාලසීමාව ක්‍රියාත්මක වන දිනයට පෙරාතුවම වූ දිනය ඉකුත් වන දිනය දක්වා එම ඉවත් කරනු ලැබූ පනතේ 2 වන වගන්තිය යටතේ ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බදු ලෙස අයකර ගැනීමට නියමිතව තිබූ සියලු මුදල්, අයකර ගැනීමට රේගු අධ්‍යක්ෂ-ජනරාල්වරයාට මෙයින් බලය පවරනු ලබන අතර, ඔහු විසින් එසේ ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බදු ලෙස අයකර ගන්නා ලද සියලු මුදල්, ඉවත් කරන ලද පනතේ 5 වන වගන්තිය ප්‍රකාරව ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කළ යුතු ය.

3. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. — අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

2—PL 005588—3,350 (2011/03)

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.